# තනතුරු ඇබෑර්තු

## සීමාසහිත පොළොන්නරුව විවිධ සේවා සමුපකාර සමිතිය

සීමාසහිත පොලොන්නරුව විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති වාණිජ කළමනාකරු තනතුර සඳහා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පදිංචි පිරිමි පාර්ශ්වයේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 01. | තනතුර | - | **වාණිජ කළමනාකරු** |
| 02. | පන්තිය | - | **II** |
| 03. | වැටුප් පරිමාණ අංකය | - | 01.03.04 |
| 04. | වැටුප් පරිමාණය | - | 19500-8X350-7X400-25100/= |

(මෙයට අමතරව උ. මැ. පලාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත ජීවන වියදම් දීමනාව රු. 8800/= ක් හා ලාභ දීමනාව උපරිමය රු. 15,000/= දක්වා ලබාගැනීමට හිමිකම් ඇත. තවද අර්ථ සාධක අරමුදල් හා සේ. නි. භාර අරමුදල් සඳහා දායක මුදල් අයකරනු ලැබේ.)

**බාහිර අයදුම්කරුවන් සඳහා**

- ❐ පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජවේදී උපාධියක් ලබා තිබීම **හෝ**
- ❐ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණ හෝ ව්‍යාපාර අධ්‍යයන උසස් ඩිප්ලෝමාව සමග පිළිගත් වෙළඳ ආයතනයක පාරිභෝගික කටයුතු පිළිබඳ මාස 6 ක පළපුරුද්ද **හෝ**
- ❐ අ.පො.ස (උසස් පෙළ) විභාගය වාණිජ අංශයෙන් සමත්වීම හා අලෙවි කළමනාකරණය පිළිබඳ පිළිගත් ආයතනයක වසරක පුහුණුවක් ලබා තිබීම.
  - ◆ දැනට සමුපකාර සේවයේ යෙදී සිටින්නන් මෙම තනතුර සඳහා අයදුම් කරන්නේ නම් සමුපකාර සේවක කොමිෂන් සභා 03/2016 චක්‍රලේඛ යටතේ මෙම තනතුරට අදාළ සුදුසුකම් සපුරාලිය යුතු වේ.

**වයස් සීමාව**

22-45 අතර (දැනටමත් සමුපකාර සේවයේ යෙදී සිටින අයට උපරිම වයස් සීමාවක් බල නොපැවැත්වේ)

**මෙම ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවීම අනිවාර්ය වේ.**

1. සියලුම අධ්‍යාපන සහතික
2. උප්පැන්න සහතිකය
3. පළපුරුද්ද පිළිබඳ සහතික
4. ග්‍රාම නිලධාරී සහතිකය (මාස 06 ක් ඇතුළත)
5. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
6. ඉල්ලුම්කරු සමුපකාර සේවකයෙක් නම් දැනට සේවය කරන සමුපකාර සමිතිය විසින් මෙම තනතුර සඳහා නිදහස් කළ හැකි බවට ලිපියක්

ඉහත සහතිකවල ඡායා පිටපත් සමග අයදුම්පත් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ තනතුරු නාමය සඳහන් කර තමන් විසින් සකස් කරගත් අයදුම්පත් **"ගරු සභාපති, සී/ස, පොළොන්නරුව වි.සේ.ස. සමිතිය, පොළොන්නරුව"** යන ලිපිනයට 2020.09.24 දින දහවල් 12.00 ට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීම කළ හැකිය.

**මෙයට**

**ගරු සභාපති,**